**හඟුරන්කෙත ප්‍රාදේශීය සභාව - 2021**

**-------------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

## 1.1 තත්ත්වාගණනය කළ මතය

හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ 2021 දෙසැම්බර් 31 දිනට ශේෂ පත්‍රය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ආදායම් හා වියදම් ගිණුම, වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 172 (1) උප වගන්තිය සහ 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට හඟුරන්කෙත ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළ කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිතියටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන පොදුවේ පිළිගත් ගිණුම්කරණ පරිචයන්ට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

ප්‍රාදේශීය සභාවේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16 (1) උප වගන්තිය ප්‍රකාරව ප්‍රාදේශීය සභාවේ වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 විගණන විෂය පථය (මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම)

---

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ ප්‍රාදේශීය සභාවේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- අදාළ ලිඛිත නීතියකට හෝ ප්‍රාදේශීය සභාව විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, ප්‍රාදේශීය සභාව ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ පහත සඳහන් අවශ්‍යතාවයන් සම්බන්ධයෙන් විශේෂ ප්‍රතිපාදන ඇතුළත් වේ .

(අ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (1) (ඇ) (iii) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ප්‍රාදේශීය සභාවේ මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6 (I) (ඇ) (iv) වගන්තියේ සඳහන් අවශ්‍යතාවය අනුව ඉකුත් වර්ෂයේදී මා විසින් සිදුකරන ලද නිර්දේශයන් ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත්ව ඇත.

## 1.6 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.6.1 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | මූල්‍ය ප්‍රකාශනවල අවස්ථා 02 කදී එකතුව රු.10,346,445 ක වත්කම් ශේෂ අත්හැරීම්ද, එක් අවස්ථාවකදී එකතුව රු.61,170 ක වියදම් අඩුවෙන් දැක්වීම්ද, පැවතුණි. | 2022 මූල්‍ය ප්‍රකාශන සකස් කිරීමේදී නිවැරදි කරන බව දන්වා ඇත. | මූල්‍ය ප්‍රකාශන නිවැරදිව පිළියෙල කළ යුතුය. |
| (ආ) | ඩිජිටල් පුස්තකාල සංවර්ධන වැඩසටහන යටතේ තොරතුරු හා සන්නිවේදන තාක්ෂණ නියෝජිත ආයතනය මඟින් දියතිලක පුස්තකාලයට සමාලෝචිත වර්ෂය තුළ ලබාදී තිබුණු නව ටැබ්ලට් පරිගණක 06 ක සහ ඡායා පිටපත් යන්ත්‍රයක වටිනාකම් ගණනය කර මූල්‍ය ප්‍රකාශනවල දක්වා නොතිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුළත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කළ යුතුය. |
| (ඇ) | සභාව සතු ඉඩම් හා ගොඩනැගිලිවල අගයන් ප්‍රත්‍යාගණනය කර නොතිබුණු අතර, වටිනාකම රු.130,963 ක් ලෙස මූල්‍ය ප්‍රකාශනයේ දැක්වූ ඉඩම් හා ගොඩනැගිලි 62ක ඒකකයක වටිනාකම රු.25 සිට රු. 5,000 දක්වා පරාසයක පැවතුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ඉඩම් හා ගොඩනැගිලිවල අගය තක්සේරු කර ගිණුම්ගත කළ යුතුය. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ඉදිරි වර්ෂය වෙනුවෙන් ගෙවිය යුතු ණය වාරිකවල වටිනාකම රු.1,543,252 ක් ජංගම වගකීම් ලෙස නොදක්වා දිගුකාලීන වගකීම් ලෙසට මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | 2022 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයට ඇතුලත් කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | කෙටි කාලීන හා දිගු කාලීන ණය ශේෂ හඳුනාගෙන ගිණුම්ගත කළ යුතුය. |
| (ඉ) | යන්ත්‍ර හා උපකරණ , රු.1,023,000 ක් ලී බඩු හා කාර්යාලීය උපකරණ යටතේද, ආයුධ ආම්පන්න රු.98,961 ක් යන්ත්‍ර හා උපකරණ යටතේ රු.9,080 ක් ලෙසද, ලී බඩු හා කාර්යාල උපකරණ යටතේ රු.89,881 ක් ලෙසද මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | වත්කම් නිවැරදි ලෙස වර්ගීකරණ කර ගිණුම්ගත කළ යුතුය. |

### 1.6.2 නොසැසඳු පාලන ගිණුම් හෝ වාර්තා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සමාලෝචිත වර්ෂයේ ගිණුම් විෂයයන් 06කට අදාළව මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන ශේෂ සහ උපයෝගී ලේඛනවල දැක්වෙන ශේෂ අතර රු.1,276,328 ක වෙනස්කම් පැවතුණි. | නිවැරදි කිරීමට කටයුතු කරන බව දන්වා ඇත. | ගිණුම් ශේෂවල වෙනස්කම් සම්බන්ධයෙන් සොයා බලා අදාළ උපලේඛන හෝ මූල්‍ය ප්‍රකාශන නිවැරදි කළ යුතුය. |

### 1.6.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| එකතුව රු.3,701,112 ක් වූ ගිණුම් විෂයයන් 08 කට අදාළව විගණනයට අවශ්‍ය තොරතුරු ඉදිරිපත් කර නොතිබුණි. | නිවැරදි කිරීමට ඉදිරියේදී කටයුතු කරන බව දන්වා ඇත. | විගණන කටයුතු සඳහා අවශ්‍ය සාක්ෂි ලබාදිය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන ආදායම ඉක්මවූ වියදම රු. 876,978 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්ම වූ ආදායම රු.8,972,042 ක් විය.

## 2.2 ආදායම් පරිපාලනය

## 2.2.1 ආදායම් රැස්කිරීමේ කාර්යසාධනය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **වරිපනම් හා බදු**<br>සමාලෝචිත වර්ෂයේ ජනවාරි 01දිනට පැවති රු.1,386,737 ක හිඟ වරිපනම් බදුවලින් 2022 අගෝස්තු 31 වනවිටත්, ඒකක 999 කින් රු.904,383 ක වරිපනම් බදු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි. | හිඟ හිටි වරිපනම් මුදල් අයකර ගැනීම සඳහා විනිශ්‍රහ බලපත්‍ර නිකුත් කිරීම් 06 ක් සිදුකර ඇති අතර මීට අමතරව අනෙක් ගෙවීම් පැහැර හැර ඇති පුද්ගලයන් සඳහා විනිශ්‍රහ බලපත්‍ර නිකුත් කරමින් පවතින බව දන්වා ඇත. | හිඟ ආදායම් අයකළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

ප්‍රාදේශීය සභා පනතේ 3 වන වගන්තිය යටතේ මහජන සෞඛ්‍ය, පොදු උපයෝගීතා සේවා සහ පොදු මංමාවත් පිළිබඳ කාරණා විධිමත් කිරීම හා පාලනය කිරීම, ජනතාවගේ සුබ විහරණය, පහසුව හා සුභසාධනය යන සභාව විසින් ඉටු කළයුතුව තිබුණු කර්තව්‍යයන් ඉටු කිරීම පිළිබඳව නිරීක්ෂණය වූ කරුණු පහත දැක්වේ.

## 3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| සභාවට අයත් මන්දාරම් නුවර පුස්තකාලය පිහිටි ක්‍රීඩාංගනය පොළ භූමියක් ලෙස සංවර්ධනය කිරීමට 2014 වර්ෂයේදී ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ මූලා ප්‍රතිපාදනවලින් රු.4,000,000 ක ව්‍යාපෘති ,ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ක්‍රියාත්මක කර සභාවට භාර දී වසර 07 ක් ගතවී තිබුණි. පොළ භූමිය තවදුරටත් සංවර්ධනය කිරීම සඳහා සභාව විසින් පළාත් පාලන දෙපාර්තමේන්තුවෙන් ඉල්ලුම් කළ ප්‍රතිපාදන නොලැබීම මත 2022 අගෝස්තු වනවිටත් පොළ පවත්වා නොතිබුණි. | ඉදිරියේදී ප්‍රතිපාදන ලද පසු මෙම භූමිය සංවර්ධනය කරන බවත්, දැනට මෙම භූමිය සභාව භාවිතා කළද, ඔප්පුවක් නොමැති බැවින් ඉඩම් පවරා ගැනීමේ කටයුතු සිදුකරන බවත් දන්වා ඇත. | පොළ පැවැත්වීමට කටයුතු කළ යුතුය. |

## 3.2 වත්කම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | සභාවේ අදහස් දැක්වීම | නිර්දේශය |
| --- | --- | --- |
| හඟුරන්කෙත ආදාහනාගාරය වෙත පිවිසෙන්නන්ට රැඳී සිටීම සඳහා රු.1,000,000 ක වියදමින් පියසක් ඉදිකර තිබුණද ගෙබිම සකස් කර නොතිබීම හේතුවෙන් එම කොටස තවදුරටත් සංවර්ධනය කළ යුතුව පැවතුණි .එමෙන්ම දැනට භාවිතා කරන ආදාහනාගරයේ වහල අළුත්වැඩියා කළ යුතුව පැවති අතර ආදාහනාගාරයේ වැසිකිළිද අළුත්වැඩියා කළ යුතුව පැවතුණි. | විගණන විමසුමෙහි පෙන්වාදී ඇති ආදාහනාගාරයේ වහල, වැසිකිළි පද්ධතිය හා ගෙබිම සංවර්ධනය කිරීම සඳහා අවශ්‍ය කටයුතු ඉදිරියේදී සිදු කරන බව දන්වා ඇත. | ආදාහනාගාරයේ අඩු පාඩු සම්පූර්ණ කළ යුතුය. |